# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

3 වන කලාපය - අංක 1

1982 ජනවාරි/මාර්තු

## පටුන


| | |
|---|---|
| කතුවැකිය | 1 - 3 |
| පුවත් | 3 - 4<br>19 - 20 |
| නව මාදිලියේ පුස්තකාල විද්‍යා පාඨමාලාවක් | 5 - 6 |
| The Book Publishing Industry in Sri Lanka From 1965 to 1980 | 7 - 9 |
| National Library of Sri Lanka: Some Thoughts from the Consultant Architect | 10 - 13 |
| කැළණි විහාරයේ විස්කම් චිත්‍ර | 15 - 16 |
| කාර්ය මණ්ඩල ප්‍රවෘත්ති | 16 - 18 |
| පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස්-6 | 17 - 18 |


## කතු වැකිය

'පුස්තකාල ප්‍රවෘත්ති' ප්‍රකාශනය නව මුහුණුවරකින් ඉදිරිපත් කරනුයේ සතුටිනි. පුස්තකාල පිළිබඳවත්, පුස්තකාල ප්‍රවෘත්ති විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳවත් උනන්දුව පුළුල්වන අවධියක මෙබඳු ප්‍රකාශනයක ඇති අවශ්‍යතාවය ගැන අමුතුවෙන් කිවයුතු නැත. පුස්තකාල පිළිබඳ කථා කිරීමේදී අද පළමුවෙන්ම සිහියට නැගෙනුයේ දැනට ඉදිවෙමින් පවතින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයයි. ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ වැඩකටයුතු මේ වසරේදී නිමවීමට නියමිතව ඇති අතර, ජාතික පුස්තකාලයට අවශ්‍ය පොත්පත් සහ අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය රැස් කිරීම, අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ගෘහභාණ්ඩ සහ උපකරණ ලබාගැනීම සහ අනෙකුත් අදාළ සැලසුම් සකස් කිරීම යන කාර්යයන්හි පුස්තකාල සේවා මණ්ඩලය දැනට නිරතව සිටී. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ මුල් අදියරේ කටයුතු සම්පූර්ණවූ විට පහත සඳහන් පහසුකම් සැලසීමට බලාපොරොත්තු වේ.

- ග්‍රන්ථ නාම 5,00,000 කින් යුත් එකතුවක්
- පාඨකයින් 320 දෙනෙක් සඳහා පහසුකම්
- ප්‍රධාන ශ්‍රවණාගාරයක් සහ කුඩා දේශන ශාලා දෙකක්
- ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථානය
- පුස්තකාල විද්‍යා අධ්‍යාපන සහ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය
- ජාතික පුස්තකාලය ආශ්‍රිත අනෙකුත් විවිධ සේවා සඳහා පහසුකම්

දැනට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විද්‍යාත්මක හා කාර්මික තොරතුරු සේවාවන්, ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව යටතේ සංවිධානයවී ඇති අතර, පසුකාලයේදී එය මව සේවාව සමග සම්බන්ධවනු ඇතැයි බලාපොරොත්තුවේ.

(3 වන පිටුවට)

අහස සිඹින ගොඩනැගිලි!

දැන් අපේ රටට අරුමයක් නොවේ.

ඒත් මහජන බැංකුව

තවත් යෝධ ගොඩනැගිල්ලක් පමණක් ම නොවෙයි.

මහජන බැංකුව

අගනුවරින් අහස් කුසට නැග ලොව බලා වදරන

ජනතාවට පිහිට වන සෘෂිවරයෙක්.

පූරා වසර විස්සක්

සිරිලක ගම් නියම්ගම් දනව් පුරවර සිසාරා

ශාඛා 290 කට අධික සංඛ්‍යාවක් ඔස්සේ

පතුරුවා හල ආර්ථික සහනය නැමති

සෘෂි දැක්මෙන්

මහජනතාවට පිහිට වූ

මහජන බැංකුව

ඔබටත් පිහිට වන්ට සූදානම්.

ඔබත් මහජන බැංකුව සමග එක්වන්න.

**මහජන බැංකුව**

ප්‍රධාන කාර්යාලය,

කොළඹ 2.

ජාතික පුස්තකාලය බිහිවීම මෑත ඉතිහාසයේ ශ්‍රී ලංකාව අධ්‍යාපන සහ සංස්කෘතික ක්ෂේත්‍රවලදී ලැබූ විශාල ජයග්‍රහණ වලින් එකක් ලෙස සැලකිය හැක. මනාලෙස සංවිධානයවූ ජාතික පුස්තකාලයත්, එයට බැඳුනු හොඳින් සංවිධානයවූ ජාතික පුස්තකාල පද්ධතියකුත් මුලු රටටම ආශිර්වාදයකි. දැනුම එකතුකර සංවිධානය කර තැබීමත්, එය ජාතියේ ඉදිරි ගමනට යෙදවීමත් සංවර්ධනය සඳහාවන නොවරදිනම ඉලක්කය ලෙස අද පිළිගනඇත. මේ අනුව ජාතික පුස්තකාලය දැනුම බෙදා හරින ආයතන රටාවක කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරනු ලබයි. ජාතික පුස්තකාලය යන ආයතනය ලංකාවට අලුත් දෙයක් ලෙස ඉදිරිපත්වුවත් එයින් ඉදිරිපත් කරන සංකල්පය එනම් දැනුම බෙදා දීම පසුගිය අවුරුදු දහස් ගණන තිස්සේ අපේ සංස්කෘතිය සමඟ කිට්ටුවෙන් බැඳී පවතින්නකි. එම පැරණි උතුම් සංකල්පය නූතන ලෝකයේ අවශ්‍යතාවයනට ගැලපෙන ලෙස සකස් වී අද ජාතික පුස්තකාලය සහ ජාතික පුස්තකාල සේවාව නමින් ඉදිරිපත්වී ඇත. ජාතික පුස්තකාලයකින් ඉටුවන කාර්යයන් පුළුල් වශයෙන් පහත සඳහන් ආකාරයට බෙදා දැක්විය හැක.

- රට තුල ඇති පුස්තකාලවලටත්, පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යා කටයුතු වලටත් නායකත්වයක් දීම.
- රට තුළ ප්‍රසිද්ධවන සහ රට ගැන ලියවුනු සියලුම වර්ගයේ ප්‍රකාශනවල ස්ථිර තැන්පත් මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම.
- විදේශීය පුස්තකාල ද්‍රව්‍ය එකතු කිරීම.
- මෙම පුස්තකාල ද්‍රව්‍ය හොඳින් සංවිධානය කොට එමගින් පර්යේෂකයින් සහ උගතුන් සඳහා උපරිම සේවාවන් සැලසීම.
- ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්කිරීම.
- ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.
- දේශීය වශයෙන් සහ අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශන හුවමාරු මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම.
- රජයේ ප්‍රධාන රාජ්‍ය පුස්තකාලය ලෙස කටයුතු කිරීම සහ ඒ මගින් රජයේ සෑම අංශයකටම අවශ්‍ය තොරතුරු සැපයීම.
- පුස්තකාල අධ්‍යාපන හා පුහුණු කටයුතු ඉටු කිරීම.
- පුස්තකාල වෘත්තියමය කටයුතු වලදී රජයට උපදෙස් දීම.
- පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ පර්යේෂණ පැවැත්වීම.

ජාතික පුස්තකාල සහ ඒ වටා සංවිධානය වූ ජාතික පුස්තකාල සේවාවන් අද ලෝකයේ සියළුම සංවර්ධනය වූ රටවලත්, සාර්ථකව සංවර්ධනය වෙමින් පවත්නා රටවලත් අනිවාර්ය අංගයක් බවට පත්වී ඇත. දැනුමත්, සංවර්ධනයත් අතර ඉතාමත් සමීප සබඳතාවයක් ඇති අතර දැනුම හොඳින් සංවිධානය කර තබා ගැනීම සහ සාර්ථකව බෙදා හැරීමට ඇති හැකියාව වර්තමාන ලෝකයේ සාර්ථකත්වයේ රහස වී ඇත. ජාතික පුස්තකාල ලෝකය පුරා උගතුන්ගේත් පර්යේෂකයින්ගේත්, රාජ්‍ය තන්ත්‍රයේත් අවධානයට යොමුවී ඇත්තේ මෙම තොරතුරු සැපයීමේ කාර්යාවලියේ කේන්ද්‍රස්ථානය ලෙස එය කටයුතු කරන බැවිනි.

ලංකා ජාතික පුස්තකාලය සහ ජාතික පුස්තකාල සේවාවන් සංවිධානය කිරීම ඉතාම භාරදූර කාර්යයක් බවට සැකයක් නැත. එම ක්‍රියාවලියේදී ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම, සෑම වර්ගයකම පුස්තකාලයාධිපතිවරයකුටම සහ පුස්තකාලයකටම උනන්දුවෙන් සහභාගි වීමට සිදුවේ. විශේෂයෙන්ම ලංකාව වැනි රටවල හිඟ සම්පතක් වූ පුහුණු පුස්තකාලයාධිපතිවරුන් මෙම ජාතික කාර්යයේදී පුස්තකාල සේවා මණ්ඩලය සමඟ ඉතාමත් කිට්ටුවෙන් කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

---

## නව සභාපති



දිවයිනේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිලා ප්‍රමුඛ අධ්‍යාපනඥයෙකු වූද. කොළඹ නාලන්ද මහා විද්‍යාලයේ හිටපු විදුහල්පති වරයාවූද, සුගුණදාස අතුකෝරාළ මහතා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නව සභාපති ධුරයට අධ්‍යාපන අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් පත්කරනු ලැබ සිටී. පුස්තකාල සේවා මණ්ඩලයේ හිටපු සභාපති එම්. ජේ. පෙරේරා මහතා ජාතික රූපවාහිනී සංස්ථාවේ සභාපති ධුරයට පත් කිරීම නිසා මෙම තනතුර පුරප්පාඩුව පැවතිණ.

මතුගම, කිරන්තිඩිය ග්‍රාමයේ උපත ලද සුගුණදාස අතුකෝරාළ මහතා කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වේ. මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ උප විදුහල්පති වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසි ඒ මහතා, පසුව මතුගම ශාන්ත මේරි විද්‍යාලයේ හා හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ධුරවල සේවය කිරීමෙන් අනතුරුව කොළඹ නාලන්ද මහා විද්‍යාලයේ විදුහල්පති වශයෙන් 1969 සිට 1981 දක්වා සේවය කළේය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ හැම අංශයකම පාහේ කටයුතු කර ඇති අතුකෝරාළ මහතා, යුනෙස්කෝ ආයතනයේ ආරාධනය පරිදි දිවයිනේ අධ්‍යාපන ක්ෂේත්‍රය අළලා විවිධ පර්යේෂණ වාර්තා කිහිපයක්ද සපයා ඇත. විශේෂයෙන් අධ්‍යාපන පරිපාලනය පිළිබඳ විශේෂඥභාවයක් දරණ ඒ මහතා, අධ්‍යාපන අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට විශේෂ කාරක සභා කිහිපයකද කටයුතු කර ඇත.

දෙමළ භාෂාව පිළිබඳව විශේෂ ප්‍රවීනත්වයක් ලබා ඇති ඒ මහතා; විදුහල්පති සංගමය, සමස්ත ලංකා මලල ක්‍රීඩා සංගමය හා සමස්ත ලංකා හොකී සංගමය ආදී සංවිධාන ගණනාවක සභාපති ධුරයේද කටයුතු කර ඇත.

# ඇම්.ජේ. පෙරේරා මහතා
## රූපවාහිනී සංස්ථා සභාපති ධූරයට

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වසරක පමණ කාලයක් සභාපති ධූරයේ කටයුතු කළ එම්. ජේ. පෙරේරා මහතා, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා ලෙස පත්වී ඇත. කෙටි කාලයක් සභාපති තනතුරේ කටයුතු කළද, ඒ කාලය තුළදී මණ්ඩලයේ කටයුතු කෙරෙහිත්, පොදු වශයෙන් රට තුළ පුස්තකාල කටයුතු කෙරෙහිත් විශාල උනන්දුවකින් පෙරේරා මහතා කටයුතු කළේය.

ජාතික පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සහ ජාතික පුස්තකාලය සංවිධාන කටයුතු පිළිබඳ ඒ මහතා විශාල උනන්දුවක් දක්වන ලද අතර විශේෂයෙන්ම ජාතික පුස්තකාල පණතක අවශ්‍යතාවය වටහා ගෙන ඒ සඳහා කෙටුම්පතක් සකස් කරන ලදී.

පුස්තකාල සේවා මණ්ලයේ සේවකයින්ගේ වැටුප් සංශෝධනය සහ තවත් සුභසාධන කටයුතු රාශියකට පෙරේරා මහතා මුල් වූ අතර, වෘත්තියක් ලෙස පුස්තකාලයාධිපති වෘත්තීය අනෙකුත් ප්‍රධාන වෘත්තීන් සමග සමසේ සිටි බව අවධාරණය කරමින් කටයුතු කරන ලදී.

පුහුණු පුස්තකාලයාධිපතීන් සඳහා සම්පූර්ණ වෘත්තීය දීමනාව ගෙවීම එතුමාගේ සමයේ ආරම්භ කළ අතර, අනෙක් ආයතනවලත් එය අනුගමනය කළයුතු බවට තීරණය කොට කරුණු ඉදිරිපත් කරන ලදී.

දිවයිනේ පුස්තකාල අධ්‍යාපන කටයුතු ක්‍රමවත්ව කරගෙන යාම ගැන අවධාරණය කළ ඒ මහතාව පුස්තකාල අධ්‍යාපන පහසුකම් නොමැති ප්‍රදේශවල පුස්තකාලයාධිපතීන් සඳහා තැපැල් මාර්ගික පාඨමාලාවක් ඇරඹීම පිළිබඳ උනන්දුවෙන් කටයුතු කළේය.

දිවයිනේ පුස්තකාල කටයුතුවලට මුල් අවදියේ පටන්ම සමීපව කටයුතු කළ පෙරේරා මහතා, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිහිටුවීමේ පුරෝගාමීව කටයුතු කළ අතර ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීමේ ආරම්භක පියවර වූ 1967 කොළඹ යුනෙස්කෝ සමුළුවෙහිද ප්‍රධාන සංවිධායකවරයෙකු විය. සභාපති පදවියෙන් ඉවත් වුවද පුස්තකාල මණ්ඩලයේ සභිකයෙකු වශයෙන් ඒ මහතා තව දුරටත් කටයුතු කරගෙන යනු ලබයි.

සැ: යු:

මෙම ප්‍රකාශනයෙහි පළවන ලිපිවල සඳහන් අදහස් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම අදාළ ලේඛකයන් වෙත පැවරේ. -

**පුස්තකාල ප්‍රවෘත්ති:**
**දෙවන කලාපයේ අංක හතර**

පුස්තකාල ප්‍රවෘත්ති දෙවන කලාපයේ අංක හතර කලාපය නිකුත් නොවූ බව කරුණාවෙන් සැලකුව මැනවි.

- සංස්කාරක -

# දිස්ත්‍රික් පුස්තකාල මගින් විවෘත විශ්වවිද්‍යාල සිසුන්ට පුස්තකාල පහසුකම්

විවෘත විශ්ව විද්‍යාල සිසුන්ට සිය අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පුස්තකාල පහසුකම් සැපයීම සඳහා දිවයිනේ ඇති මහජන පුස්තකාල උපයෝගී කර ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් සැලසුම් කර ගෙන යනු ලැබේ.

විවෘත විශ්ව විද්‍යාලයේ පාඨමාලා 1982 වර්ෂයේ ආරම්භ වත්ම දිවයිනේ නොයෙක් පළාත්වල පදිංචිව සිටින එහි ශිෂ්‍යයින් සඳහා පොත්පත් හා විමර්ශණ පහසුකම් සැපයීම බලවත් ප්‍රශ්නයක්ව ඇත. ශිෂ්‍යයින් පදිංචි ගම් හා නගරවල විවෘත විශ්ව විද්‍යාලයේ පුස්තකාල පිහිටුවීම ප්‍රායෝගික නොවන්නක් හෙයින් එම ප්‍රදේශවල පිහිටා ඇති මහජන පුස්තකාල මගින් මෙම සේවය සැපයීම ක්‍රියාත්මක කළ හැකි බව ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විවෘත විශ්ව විද්‍යාලයට යෝජනා කොට තිබේ.

විවෘත විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපති හා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂවරයා විසින් මේ පිළිබඳව පවත්වන ලද සාකච්ඡාවලදී අවශ්‍ය පොත්පත් සැපයීමේ වගකීම විවෘත විශ්ව විද්‍යාලයට භාරගත හැක්කේ නම් සේවා සංවිධානය ඒ ඒ ප්‍රදේශවල සංවර්ධනය කරනු ලබන දිස්ත්‍රික් පුස්තකාල මගින් ඉටුකරදීමට ජාතික පුස්තකාල සේවා මණ්ඩලය හා පළාත් පාලන කොමසාරිස්තුමා ක්‍රියා කරනු ඇතැයි සඳහන් වී ඇත.

# පළාත් පාලන නිලධාරීන් සහ පුස්තකාලයාධිපතිවරුන් සඳහා පුහුණු පාඨමාලාවක්

පළාත් පාලන නිලධාරීන් සහ පුස්තකාලයාධිපතිවරුන් සඳහා පුහුණුවීමේ පාඨමාලාවක් පසුගිය මාර්තු මස මුල් සතියේ පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පැවැත්විණි. මෙම පාඨමාලාව පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ අතර, දේශකයින් සපයා දීමෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සිය අනුග්‍රහය ලබා දුනි.

පළාත් පාලන ආයතන හා ඒවායේ කාර්ය භාරය, මහජන පුස්තකාල අරමුණු හා කාර්යයන්, පුස්තකාල සම්පත් අයත් කර ගැනීම, මහජන පුස්තකාලයක අභ්‍යන්තර සංවිධානය හා පරිපාලනය, වර්ගීකරණය-සූචිකරණය, මහජන පුස්තකාල හා ශ්‍රව්‍ය-දෘෂ්‍ය සේවා අන්තර් පුස්තකාල සහයෝගීතාව, විමර්ශන සේවා, පුස්තකාල පරිපාලනය, පුස්තකාල ද්‍රව්‍ය බෙදා හැරීම හා සංසරණරටාව, මහජන පුස්තකාලයක ව්‍යාප්ත සේවා යන විෂය මාතෘකා යටතේ දේශන පැවැත්වීම මෙහිදී සිදුවිය.

# නව මාදිලියේ පුස්තකාල විද්‍යා පාඨමාලාවක්

උපාලි අමරසිරි

පුස්තකාල විද්‍යා අධ්‍යාපන පහසුකම් නොමැතිවීම නිසා දුෂ්කර තත්වයකට මුහුණපා සිටින පුස්තකාලයාධිපතීන් සඳහා තැපැල් මාර්ගික පාඨමාලාවක් සංවිධානය කරලීම පිළිබඳ මූලික කටයුතු ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් නිම කර ඇත. මේ වැඩ පිළිවෙල අනුව දැනට ස්ථිර පුස්තකාල සේවයේ යෙදී සිටින, සුදුසු කම් නොලබා ඇති පුස්තකාලයාධිපතිවරුනට මෙම පාඨමාලාවට සම්බන්ධ වී අධ්‍යාපන කටයුතු කරගෙන යාමටත් අවසානයේ සහතික පත්‍රයක් ලබා ගැනීමේත් අවස්ථාව හිමිවේ.

දැනට පුස්තකාල අධ්‍යාපන කටයුතුවලට සම්බන්ධ ආයතන වල ඇති සීමිත බවත්, එම ආයතන භූගෝලීය වශයෙන්ද සීමිත ප්‍රදේශයකට සීමාවීමත් නිසා දිවයිනේ ග්‍රාමීය පෙදෙස් වල විසිරී ඇති පුස්තකාලවල සේවය කරන පුස්තකාලයාධිපතිනට අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවස්ථාවක් නොලැබී ගොස් ඇත. කැළණිය විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය දැනට පුස්තකාල අධ්‍යාපන කටයුතු පුළුල් වශයෙන් කරගෙන යනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානයන් වේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පාඨමාලා සහ සම්මන්ත්‍රණ පවත්වන අතර ජාතික විද්‍යා සභාව ප්‍රධාන වශයෙන්ම එහි විද්‍යාත්මක හා කාර්මික තොරතුරු සේවයට සම්බන්ධ පුස්තකාල වල සේවය කරන අය සඳහා කෙටි කාලීන පාඨමාලා පවත්වනු ලැබේ.

මෙම ආයතනවලට අමතරව පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සහ අධ්‍යාපන සේවා අමාත්‍යාංශය සීමිත අන්දමින් පිළිවෙලින් මහජන සහ පාසැල් පුස්තකාලයාධිපතිවරුන් සඳහා කෙටිකාලීන පාඨමාලා පවත්වනු ලැබේ. ප්‍රධාන පුස්තකාල අධ්‍යාපන ආයතනවලින් සති අන්ත පාඨමාලා පවත්වන පුස්තකාල සංගමය පමණක් අග නුවරට අමතරව මහනුවර සහ යාපනය යන මධ්‍යස්ථානවල පන්ති පවත්වනු ලැබේ. මේ තත්වය හේතුවෙන් දිවයිනේ ප්‍රධාන නගර තුන ආසන්නයේ සිටින පුස්තකාලයාධිපතීන් හට පමණක් සිය අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට අවස්ථාව ලැබී තිබේ.

## සංවිධානය

යෝජිත තැපැල් මාර්ගික පාඨමාලාව දැනට ස්ථිර සේවයේ යෙදී සිටින, ප්‍රධාන පුස්තකාල අධ්‍යාපන ආයතනවලට සම්බන්ධවීමට අපහසු පුස්තකාලයාධිපතීන්හට පමණක් සීමා වේ. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය තම තැපැල් මාර්ගික පාඨමාලාවලදී අනුගමනය කරනු ලබන ක්‍රමයම පුස්තකාල සේවා මණ්ඩලයේ තැපැල් මාර්ගික පාඨමාලාවේදීද අනුගමනය කරලීමට බලාපොරොත්තු වේ. මේ අනුව ප්‍රධාන පාඩම් මාලාවන් සහ නිබන්ධන මාතෘකා තැපැල් මගින් සපයනු ලබයි. සම්පූර්ණ කරන ලද නිබන්ධන තැපැල් මගින් ආපසු එවිය යුතු අතර පරීක්ෂාකරන ලද පිළිතුරු පත්‍ර නිවැරදි කිරීම් සහිතව ආපසු ශිෂ්‍යයින් වෙත යවනු ලැබේ.

ප්‍රධාන පාඩම් මාලා වලට අමතරව අතිරේක කියවීම් ද්‍රව්‍යයන්ද හැකි තරම් ශිෂ්‍යයන් වෙත සැපයීමටත්, එසේ සැපයීමට අපහසු පොත් පත්, සඟරා ආදිය ශිෂ්‍යයින්ගේ පරිහරණය සඳහා එම අදාළ දිස්ත්‍රික් පුස්තකාලයේ තැන්පත් කරලීමටත් බලාපොරොත්තු වේ. මීට අමතරව වරින් වර ඒ ඒ දිස්ත්‍රික් වල ශිෂ්‍යයින් එම දිස්ත්‍රික් පුස්තකාලයට රැස්කරවා එහිදී සම්මන්ත්‍රණ, සාකච්ඡා, දේශන සහ ප්‍රායෝගික පුහුණු වීම් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහි දේශණයන්ට අමතරව කැසට් පටි, ස්ලයිඩ්, සහ කෙටි චිත්‍රපට වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම වැඩ සටහන් වලට උපකාරී වන අන්දමට ශිෂ්‍යයින් කණ්ඩායම් වශයෙන් වරින් වර අගනුවරට ගෙන්වීමටත් එහිදී වඩාත් සංවිධානාත්මක පුස්තකාල පිළිබඳ අවබෝධයක් ලබා දීමත් කරනු ලැබේ. පංති කාමරයකදී ශිෂ්‍යයින් ඉදිරියේ කරන ඉගැන්වීමට වඩා ඈත පළාත්වල සිටින ශිෂ්‍යයින්ට තැපැල් මගින් ඉගැන්වීම ගැටළු සහගත කාර්යයක් වේ. ශිෂ්‍යයා ගුරුවරයින්ගෙනුත්, අනෙකුත් ශිෂ්‍යයන්ගෙනුත් වෙන්වී සිටින අතර, අතිරේක කියවීම් ද්‍රව්‍ය ලබාගැනීමත්, ගැටළුවක් ඇතිවූ විට එක්විට නිරාකරණය කරගැනීමත් දුෂ්කර වේ. මේ අන්දමට අධ්‍යාපනික වාතාවරණයෙන් වෙන්වූ ශිෂ්‍යයනට අධ්‍යාපනය දීමේදී ඇතිවන ගැටළු අවම කරලීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ. පාඨමාලාව මාස 10 – 12 කාලයකට සීමාවන අතර පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරූ සහ අවසාන පරීක්ෂණයෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත් ශිෂ්‍යයනට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

## විෂය නිර්දේශය

පාඨමාලාව සංවිධානය කරලීමේ කාර්යය පුස්තකාල සේවා මණ්ඩලයේ, පුස්තකාල අධ්‍යාපන අනු කමිටුවේ උපදෙස් අනුව පුස්තකාල අධ්‍යාපන අංශය මගින් සිදු කරගෙන යනු ලබයි. පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ඇති සංවර්ධන සභා පුස්තකාලවල සේවය කරන නුපුහුණු පුස්තකාලයාධිපතීන්ගේ ලැයිස්තුවක්, පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම පාඨමාලාවේ ප්‍රමුඛත්වය දීම් සඳහා සපයා ඇත. පාඨමාලාව සඳහා අදාළ විෂය නිර්දේශය හැකි තරම් ක්‍රමානුකූලව සහ දේශීය තත්ත්වයනට ගැලපෙන ආකාරයටත්, අන්තර්ජාතිකව පිළිගැනෙන ආකාරයටත් සකස් කර ඇත. පසුගිය වසරේ පොදුරාජ්‍ය මණ්ඩලීය පුස්තකාල සංගම් සංවිධානයේ අනුකමිටුවක් මගින් සංවර්ධනය වන රටවල

පුස්තකාල සහායකයින් සඳහා සකස් කළ විෂය නිර්දේශය, යෝජිත තැපැල් මාර්ගික පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කිරීමේදී විශේෂ සැලකිල්ලට ගන්නා ලදී. මෙය අන්තර් ජාතික පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත අනු කමිටුවක් මගින් සකස් කරන ලද අතර පසුගිය දශක කීපය තුළ ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමෙරිකානු රටවල පුස්තකාල වර්ධනයත්, එම පුස්තකාල ක්ෂේත්‍රවල ඇති සුවිශේෂ අධ්‍යාපන අවශ්‍යතාත් සලකාගෙන සකස් කර ඇත. මෙයට අමතරව පසුගිය දස වසර තුළ ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය කෙටි කාලීන පාඨමාලා හා සම්මන්ත්‍රණ පැවැත්වීමෙන්ද දිවයිනේ විවිධ පුස්තකාල ක්ෂේත්‍ර සමග සමීපව කටයුතු කිරීමෙන්ද ලැබූ අත් දැකීම් මෙන්ම රට තුළ පුස්තකාල ක්ෂේත්‍රයේ අනෙකුත් ආයතන සහ සංවිධානවල අත්දැකීම්ද උපයෝගී කරගෙන ලංකාවේ දේශීය තත්ත්වයට වඩාත් ගැලපෙන අන්දමට විෂය නිර්දේශය සකස් කර ඇත.

මෙම තැපැල් මාර්ගික පාඨමාලාව ආරම්භ කරලීම සමඟම ජාතික පුස්තකාල සේවා මණ්ඩලය රට තුල පුස්තකාල අධ්‍යාපන කටයුතුවලට වඩාත් පුළුල් වශයෙන් සම්බන්ධ වේ. පුස්තකාල අධ්‍යාපන ක්ෂේත්‍රයේදී ජාතික පුස්තකාලයක වග කීම වනුයේ තනි ආයතනයක් ලෙස හුදෙකලාව කටයුතු කිරීම නොවේ. එම කටයුතු ජාතික මට්ටමින් සැලසුම් කරලීම එහි ප්‍රධාන වගකීම වේ. ජාතික සැලැස්මක් සහිතව කටයුතු කිරීමේදී අනෙකුත් පුස්තකාල අධ්‍යාපන ආයතන සමග කිට්ටු සහයෝගිතාවයෙන් ක්‍රියා කිරීම අත්‍යාවශ්‍ය අංගයක් වන අතර ජාතික අවශ්‍යතාවයනට ගැලපෙන පරිදි සෑම පාඨමාලාවක්ම ක්‍රමානුකූලව සංවිධානය කල යුතුවේ. ඒ ඒ පාඨමාලාවල තත්වය කලින් කල විමර්ශණය කරලීමත් පවත්නා පාඨමාලාවල තත්වය උසස් කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීමත්, ඒ ඒ වර්ගයේ පාඨමාලා තරගකාරී අන් දමට සම්පත් අපතේ යවමින් ආයතන කිහිපයක අනවශ්‍ය අන්දමට පැවැත්වීම අධෛර්යමත් කරලීමත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේදී යොදා ගන්නා සම්පත් (උසස් ගුරුවරුන්, පොත් පත්, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ) ආදියෙන් සියළුම ආයතනවලට උපරිම ප්‍රයෝජනය ලබාදීමත්, අනෙකුත් අධ්‍යාපන ආයතන මගින් ඉටුකරලීමට අපහසු පුස්තකාල අධ්‍යාපන කටයුතු ජාතික පුස්තකාලය මගින් කරගෙන යාමත්, පොදුවේ සියළුම පාඨමාලා සහ සහතිකපත්‍ර පිළිබඳ රජයට උපදෙස් දීමත් පුස්ත කාල අධ්‍යාපනය පිළිබඳ ප්‍රමිති සකස් කරලීමත්, ජාතික පුස්තකාලයක පුස්තකාල අධ්‍යාපන අංශයේ ප්‍රධාන වගකීම් වේ.

ජාතික පුස්තකාලයේ කටයුතු දැන් නිම වෙමින් පවත්නා අතර එහි කටයුතු සම්පූර්ණවූ පසු එහි උතුරු කොටසේ උඩු මහලේ අංග සම්පූර්ණ පුස්තකාල විද්‍යා පාසලක් බිහිවේ. ශිෂ්‍යයින් සිය දෙනෙකුට පමණ අසුන් ගත හැකි දේශන ශාලාවක්, පනස් දෙනෙකු සඳහා ශ්‍රවනාගාරයක්, එකක පහළොස් දෙනෙකුට ඉඩ ඇති පන්ති කාමර සහ සම්මන්ත්‍රණ කාමර හතරක්, පුස්තකාලයක්, ශිෂ්‍ය විවේකාගාරයක්, පර්යේෂණ අංශයක් සහ දේශකයින් සඳහා කාමර එයට අයත්වේ. සියලුම ප්‍රායෝගික කටයුතු ජාතික පුස්තකාලයේ සිදු කරනු ලැබේ.

මෙම පුස්තකාල විද්‍යා පාසැල ප්‍රධාන වශයෙන්ම මූලික පුහුණුව ලැබූ පුස්තකාලයාධිපතීන්ගේ වැඩිදුර අධ්‍යාපන කටයුතුවලට යොදා ගැනීමට බලාපොරොත්තු වේ. මීට අමතරව ජාතික පුස්තකාලය, පුස්තකාල කටයුතු පිළිබඳ විවිධ අංශවල පර්යේෂණ කරන ස්ථානයක් වනවා මෙන්ම පර්යේෂකයින්ට විවිධ අන්දමින් උදව් දෙන ආයතනයක් ද වනු ඇත. අද ලංකාවේ පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ ඉතාමත් සීමිත වන අතර, ජාතික පුස්තකාලය විවෘත කළ පසු එහි ප්‍රධාන ශ්‍රවනාගාරය සහ අනෙකුත් පහසුකම් පුස්තකාල විද්‍යාඥයින්ගේ පර්යේෂණ හා ඒ ආශ්‍රිත සම්මන්ත්‍රණවලට නිරතුරුවම යොදා ගනු ඇතැයි බලාපොරොත්තුවේ.

# ඔබ පුස්තකාලයේ

- සහතික කරන ලද වාර්තා
- පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ කාලීන ලිපි හා විශේෂාංග
- විචාරය සඳහා පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ පොත පත
- පාඨක අදහස් හා යෝජනා (සංස්කාරකට ලියුම් තීරය සඳහා)

එවන ලෙස මෙයින් ආරාධනා කරමු!

අවකාශ ඇති පරිද්දෙන් මේවා පළ කරනු ඇත.

– සංස්කාරක

ලිපි යොමුව:

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත, කොළඹ 7. ටෙලි: 598847

# THE BOOK PUBLISHING INDUSTRY IN SRI LANKA From 1965 to 1980

A Survey on the book production in Sri Lanka during 1956 - 1980 was conducted by the C. N. L. S. B. recently. This Survey was undertaken on a request made by the N. B. D. C. of Sri Lanka. Following is an edited version of the Survey report which reveals Several interesting facts about the national book production in the island.

The National Book Development Council of Sri Lanka decided in February 1981, to have a study conducted into the state of book publishing in the country from 1956 to 1980.

"At the very begining, it was clear that 1956 was not a convenient point to start. The main reason for this difficulty is the absence of a bibliography prior to 1962. Information could have been collected from the Archives Department, but this was thought unnecessary as it was decided by us to confine the scope of the study to a statistical analysis of creative writing during this period, taking children's literature separately.

This study is therefore more a statistical one than one going into details of content of publications etc. The National Bibiography of Sri Lanka commenced publishing under the Director of Archives only in 1962. It was therefore, decided that the National Library Services Board to take the 15 year period (1965–1980) for the survey. Even here the year 1974 which marked the transfer of the compilation of the bibliography from the Department of Archives to the National Library Services Board has not been covered by the compilers.

The following report therefore, indicates the state of the publishing industry in relation to the topics selected from 1965 to 1980 (leaving 1974 out), as revealed by the National Bibligraphy of Sri Lanka. The National Book Development Council has stated that their main objective in this study is to discover through it, the paucity or otherwise of children's books in particular, while assessing the production of books in general. It was not possible to undertake any detailed study of all the publications regarding quality or contents with the staff available at the National Library Services Board. It is hoped that what follows and the statistical table annexed will enable the National Book Development Council to get an idea of the publishing industry in Sri Lanka in the area of the production of books for general reading.

The annexed statement shows the statistics for the years mentioned, of the total number of publications, publications which would fall within the category of creative writing and children's literature.

According to the figures, the average number of publications per year within the period mentioned amounts to 1376.8. When these are broken down to the language media, the average per year in Sinhala, Tamil and English amount to 690.6; 316.3 and 369.6 respectively. The averages worked out for literary productions and children's books shown as totals and broken down in to media are as follows: Total average of creative writing is 196. Average number in Sinhala is 158.3, Tamil is 23.8 and English 13.9. When averages are worked out for chidren's literature, the following dismal figures emerge: Average for all languages 29.9, Sinhala 26.91; Tamil 1.2; English 1.7. These averages are per year.

## Lean Years

Whatever the averages may show, the exact position is what there have been very lean years within the period viz 1966, 1967, 1975, 1976. The lowest number of publications have appeared in the year 1976. This seems to indicate a particular tendancy. Whenever there were severe restrictions of foreign exchange, imports etc., there has been a definite reduction in the output of books and perhaps in production in other spheres too. When the then government allowed OGL imports this is immediaetely reflected in

the increase of publications from 893-in 1966 to 1347 in 1968. Likewise the years 1975, 1976 were the most stringent control years for imports and foreign exchange expenditure within that period and this shows a decline of the publication figures which have immediately risen with the liberalization in 1977. The publications in 1977 is almost double compared with 1976 and this has kept on increasing in the years 1978 and 1979 which appears to reflect the results of the open trade policy of the present government and 1979 shown the highest figure for the 15 years period with 2703 publications. It does not of course mean that, in this year a larger number of literary works of children's books were produced. This has occurred in 1980 in which with the total of 1858 publications creative literature accounts for 277 and children's books total 82.

Creative literature, itself is a small percentage of the total number of publications. In 1965, out of 1168 publications only 86 can be included in this category of which again 35 were children's books. Of this 34 were in Sinhala and the other one in Tamil. The averages for the 15 years keep to this pattern, specially for children's literature. Sinhala books take an average of 29.9 books per year, Tamil 1.2 books per year and English 1.7 books per year. English book average is elightly higher than Tamil though there were no books published at all in 1965, 1966, 1967, 1968, 1970, 1972 and 1978. No children's books have appeared in tamil in 1972, 1975, 1977 and 1979.

## Highest Number

Among children's books in Sinhala, the highest number of books have appeared in 1980, with 77 books, and the lowest in 1973 with 9 books. In Tamil the highest number, 6, was in 1968 and in English the highest in 1969 also with 6 Books.

The general picture presented by the statistics for the 15 years may be considered as representing even the earlier years. But taking the country's development as the background against which book publishing take place, or taking publishing of books as an industry which develops or recess along with the rest of the country's industries, depending upon the availability of capital, raw material, foreign exchange etc., the situation 1965-1980 should be better than for any preceeding era. Educational levels are higher, population is greater, literacy rate greater and the importance of national languages raised higher than ever. Hence, publications in Sinhala and Tamil should be greater. Hence, if in this period, the production is so poor, what is wrong with book publishing in the country ? Isthis a eflection of a widespread poverty which does not enable parents to buy books for children ? (That is regarding children's books). Why don't people buy reading material in general ?

Although the statistics collected do not show a breakdown of all publications, a glance at the National Bibliograpy shows that most of the material in any year consists of Government publications. Even with these, there have been some years where production has been significantly low. In 1976 which is the lowest year, there were only 681 publications. The next lowest is 1966 with 760. The best years have been 1979 with 2703, 1980 with 1858, 1972 with 1744 and 1978 with 1594.

Taking children's publications, the situation right through the period examined must be considered unsatisfactory in relation to the large number of children who need reading material for their education and entertainment, outside the few school text-books they are compelled to use. Here the Sinhala publishing Sector had been much more active than the Tamil. The percentages have been given earlier, but the actual figures over the years show wide fluctuation, varying from 77 in 1980 to 9 in 1973. A total of 20 children's books (in all media) and over has been regularly maintained except in 1968 (18), 1972 (19), 1973 (12) and in this Sinhala books predominate. Tamil children's books as stated earlier has been average of 1.2 books per year. Taking individual years, the highest production has been in 1968 (6) and next comes 1966 and 1971 with two books each. There have been no publications in 1972, 1975, 1977 and 1979, and rest of the years have one each. The best year for children's books altogether has been 1980 with 82 books of which 77 are in Sinhala and only 1 is in Tamil and rest (4) are in English. What do the Tamil children read.?

## Statistics of Book Publishing in Sri Lanka for the period 1965 - 1980

| | 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1975 | 1976 | 1977 | 1978 | 1979 | 1980 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Number of books published during the year | 1168 | 760 | 893 | 1345 | 1290 | 1469 | 1489 | 1744 | 1534 | 937 | 681 | 1187 | 1594 | 2703 | 1858 |
| Sinhala | 865 | 296 | 506 | 656 | 637 | 750 | 758 | 925 | 708 | 484 | 341 | 571 | 719 | 1174 | 970 |
| Tamil | 158 | 184 | 112 | 319 | 324 | 305 | 307 | 341 | 403 | 230 | 159 | 339 | 405 | 686 | 473 |
| English | 145 | 280 | 275 | 370 | 329 | 414 | 424 | 478 | 423 | 223 | 181 | 277 | 470 | 843 | 415 |
| Creative writing | 86 | 161 | 105 | 208 | 193 | 196 | 275 | 294 | 167 | 216 | 134 | 187 | 181 | 261 | 277 |
| Sinhala | 64 | 143 | 95 | 176 | 162 | 162 | 240 | 257 | 129 | 162 | 85 | !32 | 144 | 203 | 221 |
| Tamil | 20 | 15 | 08 | 25 | 26 | 29 | 19 | 20 | 33 | 37 | 27 | 37 | 06 | 22 | 33 |
| English | 02 | 03 | 02 | 06 | 05 | 05 | 16 | 17 | 09 | 17 | 22 | 18 | 31 | 36 | 23 |
| Children's books | 35 | 30 | 23 | 18 | 29 | 27 | 31 | 19 | 12 | 24 | 22 | 20 | 33 | 43 | 32 |
| Sinhala | 34 | 28 | 22 | 12 | 22 | 26 | 24 | 19 | 09 | 22 | 17 | 19 | 32 | 41 | 27 |
| Tamil | 01 | 02 | 01 | 06 | 01 | 01 | 02 | - | 01 | - | 01 | - | 01 | - | 01 |
| English | - | - | - | - | 06 | - | 05 | - | 02 | 02 | 04 | 01 | - | 02 | 04 |

**Source** :- The National Bibliography 1965 – 73 – Dept. of National Archives
1974 – 80 – National Library Services Board

Statistics was collected by Mrs. Srimathi Gunasena and Mrs. A. Wijesinghe.

# විශේෂ සේවා ප්‍රමිති

## ළමා සේවා

49. සමාජයේ විශේෂ සැලකිල්ලට භාජනය විය යුතු පාඨක කොට්ඨාශයක් වශයෙන් ළමයින් සැළකිය යුතුය. ඔවුන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් ද විශේෂය. එහෙයින්, ළදරු කාලයේ පටන් අවුරුදු 14 පමණ කාලය වන තුරු විවිධ වයස්වලට හා විවිධ මට්ටම්වල දක්ෂතාවලට අනුකූල වන පරිදි ළමා පුස්තකාල සේවා සකස් කිරීම වැදගත්ය. මෙම සේවා සාමාන්‍ය පුස්තකාල සේවයට ආබද්ධ වනසේ පිළියෙල කර ගැනීමේ අවශ්‍යතාවය අවධාරනයෙන් සඳහන් කළ යුතුය. බොහෝ ළමයිනට බොහෝ අවස්ථාවල ළමා පුස්තකාලයට අමතර වශයෙන් සාමාන්‍ය පුස්තකාල සම්පත්වලින්ද ප්‍රයෝජන ගැනීමේ අවශ්‍යතාවය ඇතිවේ. එමනිසා, මෙම ග්‍රන්ථයෙහි, ළමා පුස්තකාල පිළිබඳ ප්‍රමිති සඳහන් කිරීමේදී හැකි සෑම අවස්ථාවකම සාමාන්‍ය පුස්තකාල සේවා හා සම්බන්ධ කොට එම ප්‍රමිතීන් සාකච්ඡා කොට තිබේ.

50. ළමා චරිතය වර්ධනය කිරීමේ කාර්යයේ දී පුස්තකාලයක් ක්‍රියා කළයුත්තේ ළමයාට හුදු තොරතුරු ලබා දීමේ මාධ්‍යයක් වශයෙන් පමණක් නොවේ. මානසික වශයෙන් ඔහු පිබිදවීමද, පුස්තකාලයකින් සිදුවිය යුතු මහඟු කාර්යයකි. මේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව නා නා මාදිලියේ ප්‍රබන්ධාත්මක පොත පත හා ශාස්ත්‍රීය පොත පත ද අතර සමතුලිතතාවයක් ඇතිවන පරිදි ගොඩ නඟා ගත යුතුය. පාසැල් වයසේ ළමයින්ගේ අවශ්‍යතා පමණක් නොව පූර්ව පාසැල් වයස්වල ළමයින් ගැන ද, කියවීම හුරුවීමට පෙර වයස්වල ළමයින් ගැන ද සැලකිල්ල යොමු කළ යුතුය. පාසැල් අධිකාරීන් සමඟ සාකච්ඡා කොට දක්ෂ ළමයින් මෙන්ම අදක්ෂ ළමයින් සඳහා ද යෝග්‍ය සේවාවන් සැලැස් විය යුතුය. ළමයින්ගේ දෙමාපියන් හා වෙනත් ඔවුනට සම්බන්ධ පුද්ගලයින්ගේ අවශ්‍යතාවයන් ද මෙම සේවාවලට ඇතුළත් විය යුතුය. මෙම ප්‍රමිතීන් සඳහන් කරන ලද්දේ මහජන පුස්තකාලයකින් සැලසුම් කළ යුතු ළමා සේවයන් සම්බන්ධයෙන් පමණකි. සෑහෙන තරම් පාසැල් පුස්තකාල නොමැති ප්‍රදේශවල ළමා පුස්තකාල සේවයෙහි අවශ්‍යතාවය මීට වඩා වැඩිවිය යුතුය. මහජන පුස්තකාල හෝ ළමා පුස්තකාලවලට අමතර වශයෙන් පාසැල් පුස්තකාල ඇති කිරීම අවශ්‍යය. ඇතැම් අවස්ථාවල සුදුසු පරිදි මෙම පාසැල් පුස්තකාල හා මහජන පුස්තකාල වලට සහයෝගිතා සේවා වන් පවත්වා ගෙන යෑමට සිදු විය හැක.

(19 වෙනි පිටුවට)

# NATIONAL LIBRARY OF SRI LANKA

## Some thoughts from the Consultant Architect

Professor Micheal Brawne, the UNESCO Consultant Architect to the National Library of Sri Lanka, paid his fourth visit to Sri Lanka recently. After four weeks of consultation, just before his departure he was Interviewed by Mr. U. Amarasiri.

QUESTION:

Prof. Brawne, you have been here a number of times. Could you please tell us the purpose of this visit?

PROF. BRAWNE -

I have of course been coming to Sri Lanka a number of times in connection with the designing of the National Library, and every building needs a number of stages at which certain actions have to be taken if the building is to be completed successfully. First of all of course, one has to choose the site, to do a design that has to be approved and then construction of drawings have to be made and construction has to be initiated and during construction new problems arise which happen because changes have occured in the way in which the client is going to use the building. Problems have arisen during construction which need to be dealt with and other issues arise which are perhaps better when dealt with initially like the design of furniture for the building. My main task of this visit was really to do two things. One was to design the specialised furniture for the library, shelves, reading desks and chairs and so on and to see how construction was coming along as well as seeing how various activities particularly different contracts were co-ordinated and specially the contracts with the general contractor for the main building and those for the mechanical services which are primarily air-conditioning and a lift.

QUESTION;


Are you satisfied with the progress of the building?

PROF. BRAWNE-


The answer is 'Yes', but it is a qualified 'Yes'. Every where in the world contrctors don't do quite as well and don't work as rapidly as one dreams that they might. But I think Mr. Muttiah is doing a very good job under fairly difficult conditions.

**CLIENT** National Library Services Board.
**SITE** South of the centre of Colombo.
**STRUCTURE** Rc, rendered brick walls, local quarry tile floors, clay tiles on corrugated asbestos roof, local hardwood stained doors and windows.
[redacted]
**CREDITS** Michael Brawne in association with Pani Tennakoon, chief architect, Ministry of Housing and Construction.
**DESCRIPTION** Building to house National Library, National Documentation Centre and number of associated agencies. Space for 500 000 volumes, 300 readers, and work spaces for 113 members of staff. In addition there are three lecture theatres and offices for associated institutions. Design differentiates between central air-conditioned zone for books and peripheral naturally ventilated area for readers. Concept is a series of open trays under vast roof with closed central core. Books and readers are on all main floors corresponding to main division of the library so that either closed or open access system can be used. Layout is predominately horizontal to avoid mechanical handling, and to reduce cost.


**NATIONAL LIBRARY, COLOMBO, SRI LANKA**




*south-west corner*




*site plan*
*key*
1, entrance
2, pool
3, reading terrace
4, entry court



*key*
1, library entrance
2, parcels
3, information
4, staff entrance
5, catalogues
6, office
7, book issue
8, readers
9, rare books
10, carrells
11, stack
12, wcs
13, plant room
14, lecture theatre
15, offices associated agencies
16, cafeteria
17, cars



*above: ground floor plan (scale 1:1200); below: cross section (scale 1:600)*



*entrance elevation*

QUESTION:

What are the alterations that you have proposed?

PROF. BRAWNE -

The main alterations are small corrections which are necessary in the plan because perhaps, they hadn't been incorperated in the drawings initially like additional electrical outlets and the position of lights in the stacks which need to be increased but really the main changes are layouts of wings for some of the new uses which the library is now planning to carry out on its premises or changed ideas about these uses; and here the principal areas are the school for librarians which is going to be established on the 2nd floor of the North wing, some additional subdivisions of wings for audio visual materials and photograpic dark room and laboratory and rooms for the Library Board, its Chairman and school library division and so on which had been left unallocated-at the times of the original design.

QUESTION:

Is there anything that you have been unable to complete?

PROF. BRAWNE -

Well, it would have been nice to have the opportunity of having more extended discussions with the consultants who are dealing with the air-conditioning and we were only able to get in touch with them at the very last moment, but I hope that the information which they will assemble and the designs that they will produce will be posted on to me in England.

QUESTION:

Do you think that there is a problem about the co-ordination, as there are a number of authorities involved in the project?

PROF. BRAWNE -

There are always problems when one is dealing with a fairly complicated bureactacy in which there isn't a very simple relationship which is the ideal relationship, in which there is a client who is one body, an architect who is another and the contractor who is the 3rd. The moment other committees, Boards, Departments intervene the responsibiltiy

(Conted on Page 13)

# ප්‍රකාශන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශිත පොතපත

- **IFLA Standards for Public Libraries: Sinhala Edition**

  **මහජන පුස්තකාල ප්‍රමිති**

  මිල රු. 4.00

- **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**
  **Sri Lanka National Bibliography**

  Annual Subscription Rs. 80.00 (Including Postage)

- **පුස්තකාල ප්‍රවෘත්ති**
  **(ත්‍රෛමාසික)**

  වාර්ෂික දායක මුදල රු. 6.00

- **මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය** - 1978

  මිල රු. 12.00

- **Catalogue of Postgraduate Dissertations in the Libraries of Sri Lanka**
  Comp. by N. Amarasinghe (in print)

- මුදල් හෝ තැපැල් ඇණවුම් චෙක් පත්
  **සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**
  නමට ලියා පහත ලිපිනයට යොමුකරන්න:

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත, කොළඹ 7. ටෙලි: **598847**

in the chain of command is more difficult and therefore new problems arise which perhaps can otherwise be avoided.

QUESTION :

Could you tell us briefly what are the main features of the National building?

PROF. BRAWNE –

Well, I suppose they could be characterised, that I hope, its a building which is in keeping and suitable to the conditions of Colombo and of Sri Lanka That it sits happily in largely still a green and beautiful area of the town which I hope will remain beautiful without too many tall buildings around it, But its main features are brought from catching one hopes, some of the characteristics of our regional architecture, in which all one in a sense needs is a shelter from the sun and rain to a big over hanging roof, a big tree is in a sense a kind of architecture which is suitable here. The main features of the library are that we have at its heart in the middle, on every floor an air-conditioned zone in which the valuable books belonging to the library and are about to come to the library will be kept safely and can be issued to readers for many, many years to come without deteriorating and around that central core are spaces which are naturally ventilated and views of trees and the sky in which the readers sit, work. librarians issue books, provide information and so on.

QUESTION :

What are the local architectural features you are incorporating in this building?

PROF. BRAWNE –

Well, I have hoped that really they belong to two categories. First of all that we will be using materials that are produced in this country, we are using local hard woods, local clay tiles on the floor, local tiles on the roof, we are making it out of the simplest possible materials of brick and reinforced concrete, but over and above that the appearance of the building has something of that solidity and weight which I think are associate with certain traditional buildings, which I certainly would associate with something like the temple of the tooth in Kandy or other important shrines in this country, but that all these however they differ in look and whether its traditional Sinhala or Tamil buildings and whether its Portuguese Colonial buildings all these have the characteristic of covering and being an important feature above them a very strong dominant large roof and I think that perhaps the most important feature of the library is a big over hanging roof.

QUESTION:

Culturally what is the importance of the National Library building, that is compared to other buildings ?

PROF. BRAWNE –

The importance of the building is that it's presumably like many other buildings, the Museum, Town Hall, New Parliament building, which is now under construction, that these are national monuments buildings by which a society and culture would like to be remembered in the future, but which will serve to the people new sense that we value, Certain ideas that we hold dear. We are willing to spend money and give them a symbolic importance which shows that our countrylives by intellect, by ideas, by our culture enshrined in words as much as it looks; by economic or industrial progress.

QUESTION:

When will the building be completed ?

PROF. BRAWNE –

That's a dangerous question to ask because it is not within my control. Its the contractor who will determine that and the Ministry and on the last resort its the Ministry of Finance, and the Treasury which will decide when it is finished, in terms of how it makes payments and how soon it makes payments and how much it is able to pay the contractor, but if all these things go well, I would think that by January 1983 we should have a completed building on Independence Avenue.

QUESTION:

It's good news indeed. Will you be visiting Sri Lanka again ?

PROF. BRAWNE –

Well, I very much hope that I will come because I am extremely fond of the country, I like coming here, so my obvious answer is that I very much hope that I should be able to come again and I would like naturally to come when the building is opened ceremonially and is going to be used by the public because thats what we are building the building for, not to look at it but for it to be used by the people but I would also like to come a little earlier just to make sure that everything is going as I think it should, that as I would imagine the Library Board would also hope that it will go.

Thank you very much Prof. Brawne, and we wish you a safe journey.

# INVALUABLE REFERENCES FOR
## THE STUDENT OF LAW

**The Law of Property in Sri Lanka:-** Professor G. L. Peiris

| | | |
|---|---|---|
| Volume ii The Landlord and Tenant | Soft Cover | Rs. 95, 00 |
| Volume iii Servitude and Partition | Soft Cover | Rs. 70. 00 |
| | Hard Cover | Rs. 90. 00 |

**The Law of Evidence in Sri Lanka**
Professor G. L. Peiris

| | |
|---|---|
| Soft Cover | Rs. 80, 00 |
| Hard Cover | Rs. 100. 00 |

**Aspects of the Actio Iniuriarum in Roman - Dutch Law**
Dr. C. F. Amarasinghe

| | |
|---|---|
| Hard Cover | Rs. 45. 00 |

**Doctrines of Sovereignty and the Separation of Powers in the Law of Ceylon**-Dr. C. F. Amarasinghe

| | |
|---|---|
| Soft Cover Rs. | Rs. 32. 50 |

**Some Concepts of Labour Law** - S. R. de Silva

| | |
|---|---|
| Soft Cover | Rs. 35. 50 |
| Hard Cover | Rs. 50. 00 |

**Industrial Conflict** - W. P. N. de Silva

| | |
|---|---|
| Soft Cover | Rs. 45. 00 |
| Hard Cover | Rs. 65. 00 |

**General Principles of Criminal Liability in Sri Lanka**
(2nd Edition) - Professor G. L. Peiris

| | |
|---|---|
| Soft Cover | Rs. 160. 00 |
| Hard Cover | Rs. 200. 00 |

**Essays on Administrative Law** - Professor G. L. Peiris

| | |
|---|---|
| Soft Cover | Rs. 100. 00 |
| Hard Cover | Rs. 130. 00 |

**The Law of Property in Sri Lanka**-Volume i (2nd ed.)-
Professor G. L Peiris - in Print

**Offences under the Penal Code of Sri Lanka** (2nd ed.)-
Professor G. L. Peiris - in Print

ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය - මහාචාර්ය ජී. එල්. පීරිස්)
(පරිවර්තනය: සේපාල රත්නායක)

| | | |
|---|---|---|
| i | කාණ්ඩය - අපරාධයක සම්පාදක ධාතු | රු. 15. 00 |
| ii | කාණ්ඩය - සාමාන්‍ය ව්‍යතිරේක | රු. 35. 00 |
| iii | කාණ්ඩය - තැත්කිරීම, අනුබල දීම හා පොදු චේතනාව | රු. 22. 50 |

ශ්‍රී ලංකාවේ සාක්ෂ්‍ය නීතිය - මහාචාර්ය ජී. එල්. පීරිස්
(පරිවර්තනය: ආචාර්ය එම්. ජේ. ඒ. කුරේ)

| | | |
|---|---|---|
| i | කාණ්ඩය - | රු. 65. 00 |
| ii | කාණ්ඩය - | රු. 75. 00 |

තෙස්තමේන්තු නඩුකරය
උසාවිගත කාර්ය පටිපාටිය හා පරිචය — රු. 75. 00

**Publishers: LAKE HOUSE INVESTMENTS LTD., COLOMBO 2.**
ප්‍රකාශනය : සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ 2.

# කැලණි විහාරයේ විස්කම් චිත්‍ර

පීටර් විජේසිංහ

ලංකාවේ චිත්‍ර කර්මාන්තයේ නූතන ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම චිත්‍ර වශයෙන් සැලකෙන කැළණි විහාරයේ බිතු සිතුවම්ද සොලියස් මැන්දිස් නමැති චිත්‍ර ශිල්පියා පිළිබඳ අප්‍රකට තොරතුරු ඇතුළත් අත් ලිපියක් ජාතික පුස්තකාලයේ අත්ලිපි අතර තැන්පත් වී තිබේ. මෙම අත් ලිපිය ශ්‍රී ලංකා සහරාවේ සංස්කාරකව සිටි පීටර් විජේසිංහ මහතා විසින් ලියන ලද්දකි. පීටර් විජේසිංහ මහතා චිත්‍ර ශිල්පි සොලියස් මැන්දිස් මහතා පෞද්ගලිකව දැනසිටි බව පෙනේ. මෙම අප්‍රකට චිත්‍ර ශිල්පියාගේ එකම නිර්මාණය යැයි සැළකෙන කැළණි බිතුසිතුවම් ඔහුගේ ශ්‍රේෂ්ඨ කලා කෞශල්‍යය දක්වන අතර ඔහු පිළිබඳ අගනා තොරතුරු ඇතුළත් වන පහත සඳහන් ලිපිය කොටස් වශයෙන් පුස්තකාල ප්‍රවෘත්ති හි පළකරමු.

– සංස්කාරක

සිත්තරුන්ට චිත්‍ර ඇඳීමටත්, කවියන්ට කවි ලිවීමටත්, ඉවහල්වන දේවල් යම් ජාතියක වටා පිටාවෙන්ම ලැබෙන්නේය. ඉතිහාසය, ඇදහිලි, විශ්වාස, ප්‍රවාද, වෘත්තාන්ත ආදි දේවලින් කවියා මෙන්ම සිත්තරාද ආශ්වාදය ලබයි. ඇදහිලි විශ්වාසාදිය වැඩිවූ තරමට කවියාද, සිත්තරාද, වැඩි වැඩියෙන් ආශ්වාදය ලබා ස්වකීය රචනා චාතුර්‍ය්‍යය වැඩි කර ගනී.

දෙවෙනි පෑතිස් සමයේ ඇතිවූ බුද්ධි විප්ලවයෙන් පසු අපගේ ජාතික කවීන්ට හා සිත්තරුන්ට ඔවුන්ගේ ශක්තීන් වඩ වඩා උරගා බැලීමට මහඟු ප්‍රස්තාවක් ලැබුණේය. ඒ වනාහි අනිකක් නොව මිහිඳු මාහිමියන් මේ රටට ගෙන ආ ශාසන දායාදය යි. බුද්ධ ධර්මය මේ රටට ගෙන ඒමෙන් පසු, ගත්කරුවන්ටද, කවීන්ට හා ශිල්පීන්ටද අමුතු ජීවප්‍රාණයක් හා ධෛර්යයක් ලැබුණේය. ඔවුහු මහත් අභිරුචියකින් පූන පූනා බුදුගුණ වැනුවෝය. කවීහු ජාතක කතා වස්තූන් පිහිට කොට ගෙන කවි ගෙතූහ. සිත්තරුද එයම පිහිට කොටගෙන සිතියම් ඇන්දෝය. මේ අතර අපේ අද්භූත දේව කතාවලින්ද ශිල්පීහු යම් තරමකට ආශ්වාදය ලැබූහ.

ලංකා ඉතිහාසය සමාරම්භයේ පටන්ම ලක්දිවට ආවේණිකවූ දේවතා පිරිසක් මිනිසුන්ගේ ඇදහිලි වලට පාත්‍රව සිටියහ. විජයාගමනයට පෙර මෙරට සිටියවුන්ගේ ආගම, භූත ඇදහීම් වලට සීමා විය. ඒ අනුව එද අදහන ලද භූත විශේෂයන් අතර උසස්වූ ද, පහත්වූද කොට්ඨාශයන් සිටිය බව සිතිය හැක. බෞද්ධාගම ගෙන එනු ලැබුවායින් පසු ආත්ම විමුක්තිය තකා භූත ඇදහීම ටිකින් ටික හැර දැමූ නමුත් මෙලොව යහපත සලකා ඔවුන්ට පුද පූජා පැවැත්වීම දිගටම කෙරුණේය. මේ නිසා පළමු සිටි උසස් භූතයෝ ප්‍රධාන දෙවිවරුන් වශයෙන්ද මධ්‍යම තත්වයේ භූතයෝ ප්‍රාදේශික දෙවිවරුන් වශයෙන්ද, පහළ පෙළේ වූවෝ යකුන් වශයෙන්ද සැලකෙන්නට වූහ.

කලා ශිල්ප නිර්මාණයෙහිලා මේ දෙවිවරුන් මෙන්ම භූත පිසාච, නාග, කුම්භාණ්ඩාදීන්ගෙන්ද අප රට ශිල්පීන් ලැබූ ආස්වාදය සුලු පටු නොවේ. ඔවුහු තම පොත පතින් කළ වර්ණනා වලින්ද, විහාර බිත්තිවල කළ කැටයම්, සිත්තම් පෙනැලි රූ ආදී කලා නිර්මාණ වලින්ද, ඉහළ පෙළේ මහේශාක්‍ය දෙවියා පටන් පහළ යක්‍ෂ පිසාච කුම්භාණ්ඩාදීන්ගෙන්ද මහත්සේ ආශ්වාදය ලැබූහ.

කිහිරැළි උපුල්වන්, සමන්, බොක්සැල්, කතරගම, දැඩිමුණ්ඩ, අය්යනායක, විභීෂණ, නාථ, පත්තිනි යනාදීහු ප්‍රධාන පංතියේ දෙවිවරුන් වන අතර, ඊට පහළින් වන තලාවු, භූමාටු දෙවිවරුන්ද, නොයෙක් විමානසථ දෙවිවරුන්ද, ඊටත් පහළින්වූ අපගේම ඔනෑකම පිට උසස් කරනු ලැබූ අප මණ බණ්ඩාර දෙවිවරුන්ද, තුන් කම්වූ,සත් කම්වූ,සැටකප්පර, කම්බිලි; කඩවර ආදී පහත් පෙළේ දේව ආත්මවල්ද, හැඩියා වටයා, මහ සොහොනා, රීරියකා, මොරටුයකා, තොටයකා ආදි පහත් තත්හි ගැනෙන යක්කුද අපට සිටිති.

කලා ශිල්ප නිර්මාණයෙහිදී මොවුන්ගෙන් අපේ ශිල්පීන් ලැබූ ආශ්වාදය අතිමහත්ය. ශිල්ප පෝෂණයෙහිලා මේ සැම අංශයකින්ම අපට ලැබුණේ මහත්ම අනුබලයකි. ගල් වැඩ, වඩු වැඩ, චිත්‍ර වැඩ, පත්වැඩ ආදී හැම වැඩකම අපේ හැකියාව ප්‍රකටවම පෙනෙන්නට විය. මේ ජාතික නිපුණකම අනුරාධපුර යුගයෙහිදී යසමල් ගැනුණේය. අපගේ සීගිරි සිතියම් අජන්තා පරපුරට දෙවෙනි නොවිය. විටින් විට පැමිණි පරසතුරු වියවුල් නිසාද, කාලිංග මාඝ වැන්නවුන්ගේ කලා ශිල්ප විලෝපනය නිසාද, පළමු වෙනි රාජසිංහයන්ගේ පොත්පත් විනාශය හා අන්තිමට යුරෝපීය තුන් කම්වූවේ ආක්‍රමණය නිසාද අපේ ශිල්ප ශාස්ත්‍ර උන්නතිය බිඳ වැටුණි.

අවුරුදු තුන්හාර සියයකටත් වැඩි කාලයක් මුළුල්លේ නොකඩවා සිදුවෙගන ආ කලාශිල්ප විනාශය අද මේ

මොහොත වනතුරුත් නැවතී නැත. ඇම්බැක්කේ මනහර දරු කැටයම් කිරිවෙයන්ට ගොදුරුවෙමින යයි. දඹුල්ලේ මහා අනර්ඝ ප්‍රතිමා ඉරිතලයි. දෙගල් දෙරුව, ගඩලාදෙණිය හා ලංකා තිලකය විනාශ මුඛයට ළංවීඇත. දිඹුලාගල මහඟු චිත්‍ර ගොමගා වනසා දැමීමට උමතු සන්නාසියෙකුට ඉඩ ලැබුණේය.

අපේ මනහර විහාර කර්මාන්ත මෙසේ සීඝ්‍ර වේගයෙන් විනාශ වෙමින යද්දී කවදත් අපූර්ව ඉතිහාස සිද්ධීන්ට රඟමඩලක්වූ කැළණිපුරයෙහි - කැළණි විහාර බිත්තින් ගෙන්ම අමුතු සිංහල සිතියම් ආරක් අභිෂේක ලැබීම අරුමයක් කොට සැලකිය යුතුය. මෙවැන්නකට ඉඩ අවකාශ ලැබෙන පරිදි කැළණි විහාර කර්මාන්තය සඳහා හෙලේනා විජයවර්ධන ළමා තැනීන් විසින් විස්කම් සිත්තරෙකු සොයා ගැනීම රටේම වාසනාවකි.

එහෙත් අපූර්ව ප්‍රතිභා ශක්තීන්ගෙන් හැඩ ගැසුණ මේ සිත්තරා තමන් කළ එක්තරා සපථයකට අනුව හෝ නැත හොත් ශිල්පයට අධිපති යම්කිසි බලවේගයකට යටත් වීමෙන් හෝ වාම්, නිහඬ දිවියක් ගත කිරීමට ඇප කැප විය. දසත සුවඳ විහිදුවමින් එක් වරක් පමණක් පිපී පුබුදුවන තලමලක් මෙන් ඔහුගෙන් කලාවට වුණු සේවය කැළණි විහාරයේ විහාර බිත්ති වලට පමණක් සීමාවීම වුවද දක්ෂයකුගේ උපරිම සේවය සිංහාසනප්‍රාප්ත වීමකැයි කිවහැක. මේ ශ්‍රේෂ්ඨ ශිල්පියා පිළිබඳ තවත් තොරතුරු පුස්තකාල ප්‍රවෘත්ති සංග්‍රහයේ මීළඟ කලාප වලින් ප්‍රකාශ කෙරෙනු ඇත.

# කාර්ය මණ්ඩල ප්‍රමිති

66. "කාර්ය මණ්ඩලය" යනුවෙන් මෙහිදී හැඳින්වෙන්නේ පුස්තකාල සේවානියුක්ත වෘත්තීය, පාලක සහ ලිපිකරු ශ්‍රේණිවලට අයත් නිලධාරීන්ය. ලිපිකාර කාර්යයන්හී නිරතවූවොත් මිස, කම්කරු, රියැදුරු, කසල ශෝධක ආදී ශ්‍රේණී මීට අයත් නොවේ.

67. මහජන පුස්තකාල සේවක කාර්ය මණ්ඩල අවශ්‍යතාවය කරුණු තුනක් මත රඳා පවතී; සේවාලාභී ජනාවාසයේ ජනගහනයේ ප්‍රමාණය, පොතපත පාවිච්චියේ බාහුල්‍යය, සේවා විපුලත්වය අනුව කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් වෙනස් වේ. දියුණු වන්නා වූ පුස්තකාල සේවයක පාඨක සංඛ්‍යාවත්, ව්‍යවහාර වන පොත්පත් සංඛ්‍යාවත් කෙමෙන් වැඩිවීම සාමාන්‍ය ධර්මතාවයකි. මෙසේ පොත්පත් ව්‍යවහාරය හා පාඨක සංඛ්‍යාව වර්ධනය වීමේ වේගය එක් අවස්ථාවකින් පසු හීන වීමට පටන් ගනී. පුස්තකාල සේවය මෙම අවස්ථාවට එළඹී විට කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය වැඩි වැඩියෙන් දැනෙන්නට පටන් ගන්නේ තොරතුරු සැපයීම හා පාඨක සේවා සම්බන්ධයෙනි.

68. කාර්ය මණ්ඩල, විශේෂයෙන්ම පුහුණු කාර්ය මණ්ඩලය, සම්බන්ධයෙන් ප්‍රමිතීන් ගොඩනගා ගැනීම සඳහා ඉතා මත් සාර්ථක පදනම වශයෙන් සලකනු ලබන්නේ "ජනගහනයේ ප්‍රමාණය" යි. එහෙත්, හුදෙක් ජනගහනය පදනම් කොට සකස් කර ගන්නා ප්‍රමිතීන් ඉහත සඳහන් කරන ලද කරුණු අනුව සුදුසු පරිදි වෙනස් කර ගැනීමට අවශ්‍ය විය හැක. විශේෂයෙන්ම වර්ධනය වෙමින් පවත්නා සේවයක යටකී ධර්මතාවයන් කෙරෙහි ආරෝපනය කරන වැදගත්කම කොතෙක් දුරට සාධාරන ද යන්න වරින්වර පරීක්ෂණයට ලක් කළයුතුය. විශාල වශයෙන් ජංගම සේවා පවත්වා ගෙන යන පුස්තකාලයන්හි විශේෂ කාර්ය මණ්ඩල ප්‍රමිති සකස් කර ගැනීමට සිදුවේ.

69. මොනම මහජන පුස්තකාල සේවයක වුව ද, පාලන කටයුතු හා උපදේශක කටයුතු ද, පොත්පත් තේරීම හා වර්ගීකරණය ද, පාඨකයින්ට අවශ්‍ය වෘත්තියමය හා තාක්ෂණික උපදෙස් ලබාදීම ද, අධ්‍යාපනික සංස්කෘතික හා සමාජයික සංවිධාන සමග සබඳතාවයක් ඇති කර ගැනීම ද, පුස්තකාල සේවාවන් නගා සිටුවීම සඳහා සැළසුම් කිරීම ද පුහුණු පුස්තකාලයාධිපතිවරයෙකු විසින් ම ඉටු කළ යුතුය.

70. ලිපි ගොනු පවත්වාගෙන යෑම, පොත් පත් නිකුත් කිරීම හා ආපසු භාර ගැනීම, පොත් එකතුන් සකස් කිරීම හා පවත්වාගෙන යෑම යනාදී දෛනික ක්‍රියාවන් ලිපිකරු ශ්‍රේණියේ කාර්ය මණ්ඩලයේ සේවාවන්ය. වෙනත් විෂයයන් පිළිබඳ පුහුණු වූවන් පුස්තකාලයේ වෙනත් කාර්යස්ථානයන්හි සේවයට අවශ්‍යවේ.

71. ජනගහනය 3,000 ක් සහිත පොත් 9,000 ක් ද, වාර සඟරා කීපයක් ද ඇති ළමා හා වැඩිහිටි සේවා පවත්වනු ලබන අපේක්ෂිත ඉතාම කුඩා ඒකකයකට පුහුණු පුස්තකාලයාධිපතිවරයෙකු පත් කිරීම සාධාරණය. තරමක ලිපිකරු සේවයක් ද අවශ්‍ය වේ.

72. දියුණු වූ පුස්තකාල සේවයක් ඇති විශාල පරිපාලන ඒකකයන් සඳහා 2,000 ක ජනගහනයට එක් නිලධාරියෙකු බැගින් පුහුණු වූ පුස්තකාලයාධිපතිවරුන් හා වෙනත් නිලධාරීන් ඇතුළු සුළු සේවක නොවන කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. ඉතා විශාල පරිපාලන ඒකකයන්හි මෙම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය මීට වඩා මදක් අඩුවිය හැකි නමුත්, 1,50,000 ඉක්ම වූ පරිපාලන ඒකකයන්හි පරිපාලනමය හා ලිපිකාර කාර්ය ප්‍රමාණය ඉතා විශාල විය හැකි අතර එම කාර්යයන් ඉතා වැදගත් වන බව ද සැළකිය යුතුය. එසේම, විශේෂ සේවාවන් සඳහා පුහුණු නිලධාරීන් අමතර සංඛ්‍යාවක් අවශ්‍ය වන බවද ඒත්තු ගත යුතුය. සුළු ජාතිකයන් හා විදේශිකයන් බහුලව වාසය කරන පෙදෙස්වල මෙම භාෂාවන් කියවීමට, ලිවීමට හා කථා කිරීමට හැකි අමතර කාර්ය මණ්ඩලයක් ද අවශ්‍ය වේ. පරිපාලන නිලධාරීන්, තාක්ෂණික නිලධාරීන්, තොරතුරු සංවිධායක නිලධාරීන් ඇතුළු නානා විශේෂඥවරුන් ඉතා විශාල පිරිසක් නුදුරු අනාගතයේ දී විශාල පුස්තකාලවල සේවයට අවශ්‍ය වන බව පැහැදිලිව පෙනෙන්නට තිබේ.

73. විශාල පුස්තකාලවල විවිධ අංශ හා විශාල ශාඛා පුස්තකාල ද ඇතුළු, සේවාවන් ගණනාවක් පවත්වා ගෙන යනු ලබන පාලන ඒකකයන්හි සෑම සේවා අංශයකටම පුහුණු පුස්තකාලයාධිපතිවරයෙකු බැගින් සිටීම අවශ්‍යය. එසේ ම

19 වන පිටුවට

# පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස්

## 6–තොරතුරු මාධ්‍යයක්

පාසල් පුස්තකාලයාධිපතීන්ට මග පෙන්වීමක් කැරෙන මෙම ලිපි පෙළෙහි මුල් ලිපි පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනයේ පළමුවන හා දෙවන කලාපවල පළ විය.

වැඩිහිටියන් වශයෙන් ජනතාවට එදිනෙද ජීවිතයේ අවශ්‍ය වන තොරතුරු සියල්ලක්ම පාහේ මුද්‍රිත පොතපතින් ලබා ගත හැකි බව බොහෝ විට අමතක කර ඇති දෙයකි. බොහෝ දෙනා මෙසේ තමාට පොතපතින් සොයා ගත හැකි තොරතුරු කිසිවකුගෙන් අසා දැන ගැනීම අපේ සමාජයේ දක්නට ඇති ලක්ෂණයකි. නගරයේ යම්කිසි පාරක් ගැන සොයන තැනැත්තා මේ පාර තියෙන්නේ කොහේදැයි හමුවන කාගෙන් හෝ ඇසීම සිරිතකි. නගරයේ සිතියමක් බැලීමට ඔහු ඉගෙනගෙන නැත. කාර්යාලයක ලිපිනය සොයන්නා දුරකතන නාමාවලියක් බලන්නේ කලාතුරකිනි. වැඩිහිටියන් වශයෙන් අවශ්‍ය වන මෙවැනි අනේක විධ වූ තොරතුරු තමාටම සොයා ගැනීමට පුරුද්දක් ඇති වන්නේ කුඩා කාලයේදී, පාසල් යන කාලයේදී තොරතුරු සොයා ගැනීමේ ක්‍රමය ඉගෙන ගෙන තිබුණොත් පමණය. එම ඉගෙනුම ලැබීමට හොඳම තැන පාසල් පුස්තකාලය වේ.

### අභ්‍යාසය

පාසල් පුස්තකාලයේ ඇති පොත්පත්, සිතියම්, තොරතුරු සංග්‍රහ, විශ්ව කෝෂ - ශබ්ද කෝෂ, මාර්ගයෙන් තොරතුරු සොයා ගැනීමේ අභ්‍යාසවලට ශිෂ්‍යයින් භාජනය කළ හැක්කේ ගුරුවරයින්ටය. පාසල් පුස්තකාලය එවැනි අභ්‍යාස සඳහා සුදුසු ලෙස සකස් වී තිබිය යුත්තේය. මෙවැනි අභ්‍යාසවලින් ලබන පුහුණුව මුළු ජීවිතයේම ප්‍රයෝජනවත් අත්දැකීමක් වන්නේය.

මෙම තොරතුරු ලබා ගැනීමේ අභ්‍යාසවලට ප්‍රයෝජනවත් ලෙස පුස්තකාලය සකස් කර ගැනීම අවශ්‍ය තොරතුරු මාධ්‍ය ලබා ගැනීම හා ඒවා පරිහරණය කරන පිළිවෙල ළමයින්ට කියා දීම පුස්තකාලයාධිපතිගේ වගකීමය.

පුස්තකාලයේ ඇති මෙවැනි සම්පත් ශිෂ්‍යයින්ගේ අවධානයට යොමු කිරීමේ ක්‍රම ගැනද පුස්තකාලයාධිපති සිතිය යුත්තේය. ළමයින්ගේ විවිධ ආශාවන් ගැන ඔහු දැන සිටිය යුතුය. ඇතැම් ළමයි නොයෙක් ක්‍රීඩා ගැන උනන්දුය. ඒ ක්‍රීඩා ගැන ඇති පොත්වල ලැයිස්තුවක් ඔවුන් අතට පත් කළ හැක්කේ නම් ඔවුන් ඒ පොත් කියවීමට පෙළඹෙනු නියතය. ඇතැම් ළමයින් සතුන්ට ආදරය ඇත. සතුන් ගැන ඇති පොත් ලැයිස්තුවක් ඔවුනතට පත්වුවහොත් ඔවුන් ඒ පොත් කියවා බැලීමට පෙළඹෙනු නොඅනුමානය. මෙම ලැයිස්තුවල ඒ පොත් ගැන කුඩා විස්තරයක් ඇතුළත් විය යුතුය.

මෙසේ ළමයින්ගේ විවිධ ආශාවන් ගැන සොයා බලා සුදුසු පොත්පත් රැස් කිරීමත්, පුස්තකාලයාධිපතිට භාර කට යුත්තකි. මෙසේ ලබාගන්නා පොතපත ප්‍රදර්ශණය කිරීමෙන් ඒ ඒ අංශ ගැන උනන්දු වන ශිෂ්‍යයින්ගේ අවධානය කෙළින්ම පොතපතට යොමු කළ හැක.

### සැලසුම් කිරීම

පුස්තකාල අභ්‍යාස සැලසුම් කිරීම ඉතා පරීක්ෂාවෙන් කළ යුත්තකි. ශිෂ්‍යයින්ට පුස්තකාලය පාවිච්චි කිරීම සඳහා පුහුණුව ලබා දීමේදී අංශ දෙකක් ගැන කල්පනා කළ යුතුය. පුස්තකාල පොත්පත් ආශ්‍රය කරගෙන තම පන්තිවල ඉගෙනීමේ කටයුතුවලට පොත්පත් උපයෝගී කර ගැනීම එක් අභ්‍යාස ක්‍රමයකි. එහිදී ශිෂ්‍යයන් ඉගෙන ගත යුත්තේ තමාගේ පාසල් අභ්‍යාසයකට විවිධ වූ පොත්වලින් උපුටාගැනීමේ දක්ෂකම ලබා දීමය. එවැනි ප්‍රයෝජනවත් තොරතුරු රැස් කර ගැනීම සඳහා අදාළ පොත්වල අදාළ පරිච්ඡේද හෝ සිතියම්, චිත්‍ර ප්‍රස්ථාර ආදී අංගෝපාංග උපයෝගී කර ගැනීම සඳහා පොත්පත් භාවිතා කරන ක්‍රමය උගන්වා දිය යුතුය. මේ සඳහා උචිත පොත් හැඳින ගැනීමට ශිෂ්‍යයා ඉගෙන ගත යුතුය.

පොත හැඳින ගන්නා පිළිවෙල කියා දීමේදී, පොතේ ග්‍රන්ථ නාම පිටුවේ තොරතුරුද පටුනෙහි සඳහන් කරුණුද, සූචිය, සිතියම් හා චිත්‍ර ලැයිස්තුව පරීක්ෂා කර එහි සඳහන් කරුණු තමාගේ කාර්යයට උචිත වන්නේද – නොවන්නේද යන්න නිගමනය කිරීමට ශිෂ්‍යයාට ඉගැන්විය යුතුය. මෙම අභ්‍යාසයේ අරමුණු කර ගත යුතු කරුණු තුනකි:

1. යම්කිසි පොතක් මුල සිට අග දක්වා නොකියවා අවශ්‍ය තොරතුරු සඳහන් කොටස් පමණක් කියවීමට සොයා ගැනීමට පුහුණු කිරීම.

2. එම තොරතුරු ඇතුළත් පරිච්ඡේද, ඡේද යනාදියෙන් අවශ්‍ය තොරතුරු සඳහන් කොටස් පමණක් කියවීමට සොයා ගැනීමට පුහුණු කිරීම.

3. විවිධ ආශ්‍රය ග්‍රන්ථවලින්, ලබාගත් විවිධ තොරතුරු ඒකාබද්ධ කර ගන්නා ක්‍රමය පිළිබඳව පුහුණුව ලබා දීම. මෙය පාසලේදී ඉගෙන ගත හැකි ඉතා වටිනා දක්ෂතාවයකි.

### ක්‍රමාවබෝධය

පුස්තකාල සැම විටම පොදුවේ පිළිගනු ලැබූ ක්‍රම පද්ධතියක් අනුව සංවිධානය කරන ලද ආයතනයක් හෙයින් මෙම ''ක්‍රම'' ගැන අවබෝධයක් නොලබා පුස්තකාලය ප්‍රයෝජනයට

[redacted]

ගැනීමට නොහැකි වන්නේය. පොත්පත් ගැන තොරතුරු අඩංගු සූචි භාවිතය, පොත්පත් විෂයයන්ට අනුව වර්ග කොට ඇති ක්‍රමය, එම වර්ග කිරීම සහ සූචි ක්‍රමය ඒකාබද්ධ කරමින් පොත් රාක්කවල ප්‍රදර්ශණය කර ඇති අයුරු, පුස්තකාලයේ විවිධ මාදිලියේ පොත්පත්/ ශ්‍රව්‍ය – දෘෂ්‍ය සංවිධානය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් නොමැතිව තමාට අවශ්‍ය තොරතුරු හෝ පොත්පත් ප්‍රයෝජනයට ගත නොහැකිය.

පුස්තකාලය පමණක් නොව, වෙනත් ඕනෑම යාන්ත්‍රිකරණය කරන ලද සංවිධානයක ව්‍යුහය හා මෙවලම් ගැන අවබෝධයක්නොමැතිව එය භාවිතය කළ නොහැක. යන්ත්‍රයකින් ලබාගත හැකි මෙහෙය ලබාගැනීමට එය ක්‍රියාත්මක කරවීමට දැනගත යුතුවා මෙන්ම, එහි විවිධ අංගෝපාංග ගැන දැන ගත යුතුය.

( මතු සම්බන්ධයි )

● විශේෂ ලියුම්කරුවකු විසිනි

---

කාර්ය මණ්ඩල . . .

16 වෙනි පිටුවෙන්

සෑම පුස්තකාලයකම ඉතාම කුඩා සේවා අංශය වුවද භාරව කටයුතු කිරීම සඳහා නිත්‍ය නිලධාරියකු සිටිය යුතුය. ඔවුන් ප්‍රධාන පුස්තකාලයාධිපතිගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ ක්‍රියා කළ යුතු අතර, පුස්තකාල සේවයේ පරමාර්ථ හා සේවා ක්‍රම පිළිබඳ අවබෝධයක් හා පුහුණුවක් ලැබිය යුතුය.

74. යම්කිසි පාලන ඒකකයක පුහුණු පුස්තකාලයාධිපතිවරු සහ මුළු සේවක මණ්ඩලය අතර පැවතිය යුතු අනුපාතය කුමක් ද යනු තීරණය කළ යුත්තේ, එම පාලන ඒකකයෙහි සේවා තත්ත්වය අනුවය. මනාව දියුණු වූ සේවාවන් පවත්වනු ලබන නාගරික ඒකකයක සේවයෙහි නියුතු සේවක මණ්ඩලයෙන් යටත් පිරිසෙයින් 33% පුහුණු පුස්තකාලයාධිපතිවරුන්ගෙන් සමන්විත විය යුතුය. කුඩා සේවා අංශ හා ශාඛා පුස්තකාල වැඩි සංඛ්‍යාවක් ඇති ඒකකයක පුස්තකාලයාධිපතිවරුන්ගෙන් එක් අයෙක් ළමා සේවා පිළිබඳ විශේෂඥයෙකු විය යුතුය. මීට වඩා විශාල පුස්තකාල සේවයක නම් වෘත්තීය නිලධාරීන්ගෙන් 1/3 ක් පමණ මෙ අංශයෙහි විශේෂ සැලකිල්ලක් දක්වන්නන් විය යුතුය.

75. මහජන පුස්තකාලයකට ඉසිලීමට සිදුවන වියදම් අතරින් ඉතා විශාල කොටසක් සේවක මණ්ඩලයේ පඩිනඩි සඳහා වෙන් කිරීමට සිදුවේ. පුහුණු වූ පුස්තකාලයාධිපතිවරුන්ගේ වේතන තීරණය කිරීමේදී දක්ෂ කාර්‍යශීලී නිලධාරීන් බඳවා ගැනීමට හැකි වන පරිදි සිත් අලවන වේතන ක්‍රමයක් සකස් කිරීම වැදගත්ය. එසේම, පුහුණු පුස්තකාලයාධිපතිවරුන් හා ලිපිකරුවන් අතර ඔවුනොවුන්ගේ කාර්‍යයන් පැහැදිලිව බෙදා වෙන් කිරීම අවශ්‍යය. ලිපිකරුවකු අතින් නිම කරවා ගත හැකි කාර්‍යයක් සඳහා පුහුණු නිලධාරියෙකු යෙදවීමෙන් වැදගත් වෘත්තීය කටයුතුවලට යෙදවිය හැකි කාලය විනාශ නොවන පරිදි කටයුතු කිරීම මනා පාලනතන්ත්‍රයක ලක්ෂණයකි.

76. දියුණු වන රටවල, පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේ පහසුකම් සුලභ නොවීම නිසා සෑහෙන සංඛ්‍යාවක් පුහුණු නිලධාරීන් සේවයට බඳවා ගැනීමේ දුෂ්කරතා ඇති වේ. ආරම්භයේ දී මෙම නිලධාරීන්ගෙන් ඇතැමෙකු විදේශීය රටවලට යවා පුහුණු කරවා ගැනීමටද සිදුවේ. මෙවැනි තත්ත්වයක් ඇති වුවහොත් පුස්තකාල අධ්‍යාපන පහසුකම් දියුණු වන තුරු සේවක මණ්ඩලයට සේවාස්ථ පුහුණුවක් ලබා දීමට කටයුතු කළ යුතුය.

(ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශිත ''මහජන පුස්තකාල ප්‍රමිති'' ග්‍රන්ථයේ 27-29 පිටුවලින් උපුටා ගැනිණ)


# විශේෂ දීමනාවක්

අළුත් අවුරුදු සුභ පැතුම් සමග
ඔබට විශේෂ දීමනාවක්!

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ
1982 වර්ෂයේ ග්‍රාහකයන් වෙත
1973 වාර්ෂික වෙළුමේ පිටපත්නොමිලයේ සපයනු
ලැබේ. (එක් වර්ෂයක් සඳහා දායක මුදල. (රු. 80.00 කි).

මෙම දීමනාව වලංගු වන්නේ 1982 සැප්තැම්බර් මස
පළමු වැනි දින දක්වා පමණකි.

එහෙයින් ඔබේ දායක මුදල් හෝ ඇනවුම අදම අපවෙත එවන්න.

අධ්‍යක්ෂ/ලේකම්,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ - 07. ටෙලි: 59Ꮺ847

# මධ්‍ය පුස්තකාලයේ පස් වසරක පිය සටහන්

දෙහිවල-ගල්කිස්ස නගරසභා මධ්‍ය පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපතිනි සුනිතා සෙනෙවිරත්න

දෙහිවල ගල්කිස්ස නගර සභා පුස්තකාල ප්‍රණාලියේ පුරුක් වශයෙන් ගැනෙන ශාඛා පුස්තකාල, ස්වාධීනව අනාදිමත් කාලයක සිට පැවතුනත්, ඒවායේ ජීවනාලිය බඳු මධ්‍ය පුස්තකාලය බිහිවී දනට ගෙවී ඇත්තේ පස් වසරක් පමණි. දෙලක්ෂ පණස්දහසක් පමණ විශාල ජනකායකින් සමන්විත දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව මගින් පුස්තකාල සේවාව ලබා දීමට මුල පුරන ලද්දේ කරගම්පිටිය පුස්තකාලය ආරම්භ කිරීමෙන් පසුවය. ඉන් අනතුරුව එම නගර සභාව මගින්ම ආරම්භ කළ ගල්කිස්ස මහජන පුස්තකාලයද, නගර සභාව යටතේ වෙනම පුස්තකාලයක් වශයෙන් පැවතුනි.

මෙවන් යුගයක පුස්තකාල සේවාවන් ඒකාබද්ධ කොට ජනතාවට පෘථුල පුස්තකාල සේවාවක් සැපයීමේ අභිමතාර්ථයෙන් මධ්‍ය පුස්තකාලය බිහි විය. මධ්‍ය පුස්තකාලය විවෘත කරන ලද්දේ 1977 ජුනි මස 17 වන දිනය. දියුණු පුස්තකාලයකට විශේෂයෙන් අවශ්‍ය වන විමර්ශන අංශය, බැහැර දෙන අංශය, ළමා අංශය, අධ්‍යයන සහ පුවත්පත් අංශය, සඟරා අංශය වැනි පරිපූර්ණ අංශවලින් පමණක්ම පාඨක සේවාව ප්‍රමාණවත් නොවන බව වැටහී ගියෙන්, එයට අමතරව රූප වාහිනී සේවාව, අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ චිත්‍රපට ප්‍රදර්ශණය සහ එක් එක් විෂයයන් කෙරෙහි නිපුනත්වයක් ඇති විද්වතුන් යොදවා දේශන පැවැත්වීමද ක්‍රියාත්මක වේ.

මධ්‍ය පුස්තකාලය මගින් පාලනය කරනු ලබන ශාඛා පුස්තකාල දෙකකි. එනම්: ගල්කිස්ස සහ අත්තිඩිය ශාඛා පුස්තකාලයන්ය. ඊට අමතරව කරගම්පිටිය, එස්. ද එස් ජයසිංහ කියවීම් ශාලාව සහ නැදිමාල කියවීම් ශාලාව පාඨක ප්‍රයෝජනය සඳහා විවෘත කර ඇත. මෙසේ ශාඛා පුස්තකාල දෙකකින් හා කියවීම් ශාලා තුනකින්ද සමන්විත මධ්‍ය පුස්තකාලීය කාර්ය මණ්ඩලය පළමුවන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති ඇතුළු විසිහතර දෙනෙකුගෙන් සමන්විත වේ.

මධ්‍ය පුස්තකාලයේ පස් වසරක ප්‍රගතිය සැමරීම නිමිත්තෙන් 1982 ජනවාරි මස දෙවන දින උත්සව මාලාවක් පවත්වන ලද අතර, එහි එක් අංගයක් වූ ප්‍රදර්ශණයේදී පොත් තොගය වර්ධනය, සාමාජික වර්ධනය, පාඨක වර්ධනය, පුස්තකාලයට වෙන් කරන ලද මුදල් ආදී කරුණු යටතේ පුස්තකාලයේ ප්‍රගතිය දක්වන ලදී. මෙම ප්‍රදර්ශණ කටයුතු සංවිධානය කිරීමෙහිලා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන්ද අනුග්‍රහය ලැබිණි.

මධ්‍ය පුස්තකාලය මගින් මෙහෙයවන ලද මෙම ප්‍රදර්ශණයට අමතරව, පුස්තකාලයේ ආරාධනය පරිදි ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සහ පුස්තකාල සේවා මණ්ඩලයේ අභිමතාර්ථයන් අළලා ප්‍රදර්ශණයක්ද පවත්වන ලදී. මහජන පුස්තකාල සේවයක වැදගත්කම අළලා පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ ඒ. ඩී. ඩී. ගුණසේකර මහතා විසින් දේශනයක් පවත්වන ලදී.

මෙයට අමතරව මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ පොත්පත් හා ඡායාරූප ඇතුළත් ප්‍රදර්ශණයක්ද, පාර්ලිමේන්තු මන්ත්‍රී වි. ජ. මු. ලොකුබණ්ඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහජන පුස්තකාල සේවාව අළලා සම්මන්ත්‍රණයක්ද පවත්වන ලදී.

මධ්‍ය පුස්තකාලයට පස් වසරක් පිරීම නිමිත්තෙන් පැවැත්වූ මෙම උත්සවයේ විශේෂ අංගය වූයේ මෙම පුස්තකාලය විවෘත කළ දින සිටම පොත්පත්වලින් හා වෙනත් මාර්ගවලින් පුස්තකාලයේ දියුණුව උදෙසා කැපවීමකින් කටයුතු කළ ආචාර්ය බුද්ධදාස පී. කීර්තිසිංහ මහතා විසින් පරිත්‍යාග කරන ලද පොත්පත් තෑන්පත් කළ අංශය සහ රූපවාහිනිය සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති ගරු ඊ. එල්. බී. හුරුල්ලේ මැතිතුමා අතින් විවෘත වීමයි.

මෙම උත්සව මාලාව දෙහිවල ගල්කිස්ස නගරාධිපති රාජා වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

### විශේෂ සේවා

(9 වන පිටුවෙන්)

51. පුස්තකාලීය හෝ බාහිර ළමා සේවා සඳහා ශ්‍රව්‍ය-දෘෂ්‍ය පාඨක ද්‍රව්‍ය ඉතා ප්‍රයෝජනවත් වේ. අධ්‍යාපනික කටයුතු සඳහා සකස් කරන ලද විශේෂ පාඩම්ද මීට ඇතුළත් වේ. පොතපතෙහි අඩංගු කරුණු වඩා හොඳින් ළමා සිත් තුළට කාවැද්දීමට බණ්ඩ-සේයාපටි හා සේයා රාමු කාර්යක්ෂමව උපයෝගී කරගත හැක. එසේම, සංගීතය හා වාද්‍ය තොරතුරු ග්‍රැමෆෝන් තැටි හා ශබ්ද පටි මාර්ගයෙන් වඩා චිත්තාකර්ෂණීයව ඉදිරිපත් කළ හැක.

52. ළමා පුස්තකාල සේවයේ නිරත පුස්තකාල සේවක මණ්ඩලය විසින් ළමා සේවා අවශ්‍යතා ද, එම අවශ්‍යතා ඉටු කරලීම සඳහා ඇති පුස්තකාල සම්පත් ගැන ද හොඳ වැටහීමක් හා දැනීමක් ලබා ගත යුතුය. එසේම ළමා සේවාවලට අදළ කටයුතු කෙරෙනපාසල්, යෞවන සමිති, පෙර පාසැල් ආයතන, ගුරු දෙගුරු සංගම් යනාදිය සමග ද, ගුරු හා වෙනත් එවැනි වෘත්තීයන්හි නිරත පුද්ගලයින් සමගද කිට්ටු සම්බන්ධතා ඇති කර ගැනීම තම සේවාවන් ඵලදායි ලෙස ඉටු කරලීමට උපකාරී කරගත හැකි මාර්ගයන්ය.

(මහජන පුස්තකාල ප්‍රමිති 21-22 පිටුවලින් උපුටා ගන්නා ලදී.)

நூலகச் செய்தி தொகுதி 3 இல. 1, ஜனவரி / மார்ச், 1982

LIBRARY NEWS Vol. 3 No. 1 January / March, 1982

## ගුවන් විදුලි සංස්ථා පුස්තකාලය ප්‍රතිසංවිධානය වේ !

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පුස්තකාලය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් ඉල්ලීමක් කර තිබේ.

දැනටමත් ගුවන් විදුලි සංස්ථාවේ ආශ්‍රය පුස්තකාලය, නිබන්ධන හා පැරණි ලේඛන පුස්තකාලය සහ තැටි හා පටි ගබඩා පුස්තකාල ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්‍ෂවරුන් වන උපාලි අමරසිරි මහතා සහ නාලිනී ද සිල්වා මෙනෙවිය විසින් සමීක්‍ෂණයට භාජනය කර ඇත. ඊට අදාළ වාර්තාව පිළියෙල කරමින් පවතී.

## අන්තර්ජාතික ප්‍රකාශන සමුළුවට ජාතික පුස්තකාල සේවා අධ්‍යක්‍ෂ

යුනෙස්කෝ ආයතනයේ මෙහෙයවීමෙන් පැරිසියේ පැවැත්වුන "ප්‍රකාශන සෑම දෙනාටම ලබා ගැනීම" (යූ. ඒ. පී.) පිළිබඳ පැවැත්වෙන අන්තර්ජාතික සමුළුව සඳහා ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් සහභාගි වූයේ ජාතික පුස්තකාල සේවා අධ්‍යක්‍ෂ එන්. අමරසිංහ මහතාය. මැයි මස පළමුවන දින සිට දහතුන්වන දින දක්වා පැවැති මෙම සමුළුව විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවලට ප්‍රකාශන ලබා ගැනීම සම්බන්ධයෙන් උද්ගතව ඇති ගැටළු පිළිබඳ අවධානය යොමු කරතැයි අපේක්‍ෂා කෙරේ.

## පේරාදෙණි සරසවියේ නව පුස්තකාලයාධිපති

එන්. ටී. එස්. ඒ. සේනාධීර (බී. ඒ. ගෞරව), පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා (ලන්ඩන්) මහතා පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ නව පුස්තකාලයාධිපතිවරයා වශයෙන් පත්වී සිටී. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල පිළිබඳ ගෞරව උපාධිධරයෙකු වන සේනාධීර මහතා, කෙටි කාලයක් ගුරු වෘත්තියෙහි යෙදී සිට පසුව ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ සහකාර ලේඛනාරක්‍ෂක තනතුරට පත්වන ලදී. අනතුරුව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් සේවයට පත් වූ ඒ මහතා, පසුව එහි විමර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයා වශයෙන් කටයුතු කළේය. 1976/77 කාල සීමාවේ ඩෙන්මාර්කයේ පුස්තකාල කටයුතු පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ඇති ඒ මහතා, දිවයිනේ පුස්තකාල විද්‍යා අධ්‍යාපන කටයුතුවලදීද විශේෂ උනන්දුවකින් කටයුතු කරන අයෙකු ලෙසද හැඳින්විය හැක.

පුස්තකාල ප්‍රවෘත්ති
ත්‍රෛමාසික ප්‍රකාශනය: ආරම්භය 1973
3 වන කලාපය අංක: 1
1982 ජනවාරි/මාර්තු

සංස්කරණය හා ප්‍රකාශනය:

පුස්තකාල සේවා අංශය,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

කලාපයක මිල: රු. 1.50

වාර්ෂික දායක මුදල: රු. 6.00 (තැ.ගා. සමග)

දායක මුදල්

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නමට ලියනු මැනවි

සියළුම ලිපි හා විමසීම්:

අධ්‍යක්ෂ/ලේකම්,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත, කොළඹ 7.
ටෙලි: 598847

සමයවර්ධන–කොළඹ 10.

# National Digitization Project

## *National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/11
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/11

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*